# SUGGESTED SOLUTIONS

NOT FOR SALE

## KE3 (B) – Fundamentals of Law

සැප්තැම්බර් 2017

All Rights Reserved

# 1 කොටස

**පිළිතුරු අංක 01**

1.1

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 1.4.2 |
| පිටු අංක:22/23/25/27 |
| **නිවැරදි පිළිතුර: C** |

1.2

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.2.1 |
| පිටු අංක :49/56 |
| **නිවැරදි පිළිතුර: D** |

1.3

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.5.2 |
| පිටු අංක :70 |
| **නිවැරදි පිළිතුර: D** |

1.4

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 3.3.1 |
| පිටු අංක :90 |
| **නිවැරදි පිළිතුර: B** |

1.5

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 3.2.1 |
| පිටු අංක :85 |
| **නිවැරදි පිළිතුර: C** |

1.6

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 4.2.1 |
| පිටු අංක :114 |
| **නිවැරදි පිළිතුර: C** |

1.7

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.4.1 |
| පිටු අංක :134 |
| **නිවැරදි පිළිතුර: C** |

1.8

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.2.1/5.5.1 |
| පිටු අංක :127/128 |
| **නිවැරදි පිළිතුර: B** |

NOT FOR SALE

1.9

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 7.1.1/7.1.3 |
| පිටු අංක: 214/215 |
| **නිවැරදි පිළිතුර: A** |

1.10

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 8.2.1 |
| පිටු අංක: 228/229 |
| **නිවැරදි පිළිතුර: B** |

NOT FOR SALE

**(මුළු ලකුණු 2 x 10= 20)**

# 2 කොටස

**පිළිතුර 02**

2.1

| ඉගෙනුම් ප්‍රතිඵල: 1.2.1 |
|---|
| පිටු අංක: 9 |
| ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ අඩංගු වන ප්‍රධාන නීති කිහිපයක් පහත දක්වා ඇත:<br><br>• රෝම ලන්දේසි නීතිය හෝ පොදු නීතිය.<br>• ඉංග්‍රීසි නීතිය<br>• උඩරට නීතිය, තේසවලාමේ නීතිය, මුස්ලිම් නීතිය ආදී පුද්ගල නීති.<br>• බෞද්ධාගමික නීතිය<br>• හින්දු ආගමික නීතිය<br>• නීති සම්පාදනය හෝ ව්‍යවස්ථාපිත නීති<br>• චාරිත්‍රානුකූල නීති (සිරිත් විරිත්) |

2.2

| ඉගෙනුම් ප්‍රතිඵල: 3.1.1 |
|---|
| පිටු අංක: 81 |
| විකිණීමේ ගිවිසුමක් සහ විකිණීමට එකඟවීමේ ගිවිසුමක් අතර ඇති ප්‍රධාන වෙනස පහත පරිදි වේ:<br><br>භාණ්ඩ විකිණීමේ ගිවිසුමකදී භාණ්ඩයේ අයිතිය ගිවිසුම ඇතිවන අවස්ථාවේදීම විකුණුම්කරුගෙන් ගැණුම්කරුට පැවරෙන නමුත්,<br><br>විකිණීමට එකඟවීමේ ගිවිසුමකදී භාණ්ඩයේ අයිතිය පැවරීම අනාගත දිනයකදී හෝ පසුව ඉටුකළ යුතු කොන්දේසියකට යටත්ව සිදුවේ. |

2.3

| ඉගෙනුම් ප්‍රතිඵල: 3.6.1 |
|---|
| පිටු අංක: 255/256 |
| පිරිවැය, රක්ෂණ, නැව්කුලී (CIF) ගිවිසුමකදී ගැණුම්කරුවකුගේ කාර්යභාරය පහත පරිදිවේ:<br><br>• ලේඛන ලැබුන වහාම ප්‍රවාහන කුලිය හැර අනෙකුත් මිල ගණන් ගෙවීම (භාණ්ඩ පරීක්ෂා කරන තෙක් ඔහුට ගෙවීම් අතපසු කිරීමට හැකියාවක් නැත).<br>• නෞභාර පත්‍රයට අනුව, ගමනාන්ත වරායේදී බඩු බෑමට වැයවන වියදම, බත්තල් ගාස්තුව හා බිම් කුලී ගෙවීම.<br>• ආනයන බදු සහ රේගු ගාස්තු ගෙවීමට ඇත්නම් ඒවා ගෙවීම. |

2.4

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 7.3.2 |
| පිටු අංක: 206/207 |
| 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක (විශේෂ විධිවිධාන) පනත යටතේ කාන්තා සේවකයන්ගේ වැඩකරන පැය ගණන සම්බන්ධයෙන් පනවා ඇති සීමාවන් පහත දක්වා ඇත:<br>• දිනකට පැය 09 කට වඩා වැඩ නොකළ යුතුය. (අතිකාල පැය ගණන්ද ඇතුළත්ව)<br>• රාත්‍රී 8.00 න් පසු සේවය නොකළ යුතුය.<br>• හෝටල්, භෝජනාගාර සහ ගුවන් සේවාවල සේවය කරන කාන්තාවන් ඉහත සීමාවන්ගෙන් බැහැර වේ. |

2.5

| |
|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 8.2.1 |
| පිටු අංක:235 |
| 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ හඳුනාගත් බුද්ධිමය දේපළ පහත දක්වා ඇත:<br>• ප්‍රකාශන අයිතිය<br>• කාර්මික සැලසුම්<br>• පේටන්ට් බලපත්‍ර<br>• ලකුණු සහ වෙළඳ සලකුණු<br>• වෙළඳ නාම<br>• සංයුක්ත පරිපථයන් සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ<br>• භූගෝලීය දර්ශක |

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

## 3 කොටස

**පිළිතුර 03**

(a)

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 2.1.1 | |
| පිටු අංක: 45 | |

<u>නඩුවේ නම:</u>

මෙම සිද්ධියේ කරුණු "ෆෙල්ත්වස් එදිරිව බ්‍රින්ලි " (1862) 11 CB (NS) 869 විනිශ්චිත නඩුවේ කරුණු වලට සමානවේ.

<u>නඩුවේ කරුණු:</u>

තම බෑණා වන බ්‍රින්ලි (B) ගේ අශ්වයා මිලදීගැනීමට ලිපියකින් අර්පනය කල ෆෙල්ත්වුස් (F) පැවසුවේ "මෙම අර්පණය ගැන කිසිවක් මා හට දැන ගන්නට ලැබෙන්නේ නැත්නම්, අශ්වයා ඇමෙරිකානු ඩොලර් 30 කට , මා හට හිමිවන බව සලකමි " යනුවෙනි.

"B" මෙයට කිසිදු ප්‍රතිචාරයක් දැක්වූයේ නැති මුත් "B" තම වෙන්දේසිකරුවාට, වාචිකව ප්‍රකාශකළේ, මෙම අශ්වයා දැනටමත් "F" ට විකුණා ඇති බවයි. වැරදීමකින් අශ්වයා වෙන්දේසියකදී වෙනත් අයෙකුට විකුණුවේය.

F විසින් කරන ලද අර්පනය B විසන් ප්‍රතිගණනය කර නැති බැවින් හා නියමාකාරයෙන් F ට සන්නිවේදනය නොවූ බැවින් F සහ B අතර වලංගු ගිවිසුමක් ඇති නොවූ බව මෙම නඩුවේදී තීරණය විය.

අර්පනය සහ ප්‍රතිග්‍රහණය යන ඒවායේ මූලධර්මවලට අනුව ප්‍රතිග්‍රහණය, අර්පනකරුට සන්නිවේදනය කළයුතුය. මෙය ලිඛිතව හෝ වාචිකව හෝ හැසිරීමෙන් (ව්‍යංගයෙන්) විය හැක.

අර්පනලාභියාගේ නිශ්ශබ්දතාවය හෝ අක්‍රීය බව වලංගු ප්‍රතිග්‍රහණයක් ලෙස සලකන්නේ නැත. වෙනත් වචනවලින් කිවහොත් මානසිකව පිළිගැනීම හෝ ප්‍රත්‍යක්ෂ නොවූ පිළිගැනීමක්, යෝජනාවක් පිළිගැනීමට හේතු පාදක නොවේ.

එබැවින්, මෙම සිද්ධියේදී "ටොම්" වෙන්දේසිකරුට තම මෝටර් කාර් රථය විකුණා ඇති බව දැන්වුවද (සන්නිවේදනය කළද) "ටොම්" එවැනි පිළිගැනීමක් අර්පනකරු වන ෆ්‍රෑන්ක්ට සන්නිවේදනය කර නැත.

එබැවින් ගිවිසුම් නීතියට අනුව මෙහි නියමාකාර පිළිගැනීමක් නැත.

NOT FOR SALE

(b)

| ඉගෙනුම් ප්‍රතිඵල: 2.1.1 |
| --- |
| පිටු අංක: 39 |

<u>නඩුවේ නම:</u>

සමාන කරුණු කාලිල්ට එරෙහිව කාබොලික් ස්මෝක් බෝල් සමාගම ***[1893] 1 Q.B. 256*** නඩුවේදී සාකච්ජා කරන ලදී.

<u>නඩුවේ කරුණු:</u>

නියමකර තිබෙන ආකාරයට තමන්ගේ ස්මෝක් බෝල් (smoke ball) නිෂ්පාදන පාවිච්චි කිරීමෙන් පසුව ඉන්ෆලුවෙන්සා රෝගය වැළදුන අයෙකුට පවුම් 100 ක තිළිණයක් ලබාදෙන බවට කාබොලික් ස්මෝක් බෝල් සමාගම අර්පනය කරන ලදී. නියම කරන ලද ආකාරයට ස්මෝක් බෝල් පාවිච්චි කිරීමෙන් අනතුරුව කාලිල් මහත්මියට ඉන්ෆලුවෙන්සාව වැළදුනි. ඇය පවුම් 100 තිළිණයට හිමිකම් පෑවද, සමාගම එම මුදල ඇයට දීම ප්‍රතික්ෂේප කළේය.

<u>තීන්දුව</u>

මෙය ලෝකයටම පුළුල්ව කරන ලද අර්පනයක් බැවින්, නියම කරන ලද පරිදි ස්මෝක් බෝල් පාවිච්චි කිරීමෙන්, කාලිල් මහත්මිය අර්පනය අනුව ක්‍රියා කිරීම ඇය අර්පනය ප්‍රතිග්‍රහනය කළා හා සමානය. එබැවින් සාමගම ඇයට පවුම් 100ක තිළිණය ගෙවීමට බැඳුනි.

මෙම සිද්ධියේදී SPL පුවත්පත් දැන්වීමක් පළකරීම මුළු ලෝකයටම අර්පනයක් කළා සේ සැලකේ. එවැනි අර්පනයක්, කොතැනක හෝ සිටින ඕනෑම අයෙකුට කළ හැක.

එබැවින් එවැනි අර්පනයක් ඕනෑම කෙනෙකුට ප්‍රතිග්‍රහණය කළ හැක.

මෙවැනි අර්පනයක් පිළිගැනීම, හුදු ක්‍රියාවකින් කළ හැකි අතර, එය පිළිගත් බවක් අර්පන ලාභියාට, විශේෂයෙන් සන්නිවේදනය කිරීම අවශ්‍ය නොවේ.

එබැවින්, මෙම සිද්ධියේදී, සමාගම විසින් වලංගු අර්පනයක් සම්පත්ට කර ඇති බැවින් සහ සම්පත් විසින් ක්‍රියාවෙන් මෙම අර්පනය ප්‍රතිග්‍රහණය කර ඇති බැවින් සම්පත්ට රු. 25,000 ක තිළිණයක් ගෙවීමට SPL සමාගම බැඳී සිටී.

**(මුළු ලකුණු 10)**

පිළිතුර **04**

(a)

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 5.7.6 | |
| පිටු අංක: 151 | |

සාමාන්‍ය වශයෙන් විශ්‍රාම යන හවුල්කරු ඔහුගේ විශ්‍රාම යාමෙන් පසුව හවුල් ව්‍යාපාරය විසින් ඇතිකර ගන්නා ණය වලට වගකීමට නොබැඳේ.

තවදුරටත් ණයහිමියා පූර්ව කාලයේදී ආයතනය සමඟ ගනුදෙනු කර නොමැති විටදී සහ විශ්‍රාම යන හවුල්කරු පෙර හවුල්කරුවෙකු බව නොදන්නා විටදී හෝ විශ්‍රාම යන හවුල්කරුගේ විශ්‍රාම යාම පිළිබඳ දැනුම්දීම කර ඇතිවිටදී එවැනි ණය සඳහා විශ්‍රාම යන හවුල්කරු වගකීමට නොබැඳේ.

මෙම දෙනලද සංසිද්ධියේදී තරුණි පූර්වයේදී හවුල් ව්‍යාපාරය සමඟ ගනුදෙනු කර නොතිබූ අතර ඉම්රාන් හවුල්කරුවෙකු වූ බව නොදැන සිටියාය.

එමනිසා ඔහුගේ විශ්‍රාම යාම පිළිබඳ දැනුම්දීම නොකර තිබුනත් මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් ඉම්රාන් තරුණිට වගකීමට නොබැඳේ.

(b)

| | |
|---|---|
| ඉගෙනුම් ප්‍රතිඵල: 4.3.1 | |
| පිටු අංක: 106 | |

**බිල්පතක් ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කිරීමට අදාල නීති රීති**

- බිල්පත කල් ඉකුත්වීමට පෙර, ව්‍යාපාර කටයුතු කරන දිනක, සාධාරණ වේලාවකදී ඉදිරිපත් කළ යුතුය.
- බිල්පතක් හවුල්කරුවන් නොවන දෙදෙනෙකුට හෝ ඊට වැඩි අණලද්දන් සංඛ්‍යාවක් අමතා ඇති අවස්ථාවක, සියළුදෙනා වෙනුවෙන් ප්‍රතිග්‍රහණයට එක් අයෙකුට බලය පවරා නැත්නම්, ප්‍රතිග්‍රහණය සඳහා ඒ සියළු දෙනාටම ඉදිරිපත් කළ යුතුය.
- අණලද්දා මියගොස් ඇති විටක, ඔහුගේ පෞද්ගලික නියෝජිතයාට පිළිගැන්විය හැකිය.
- අණලද්දා වස්තුභංගත්වයට පත්ව ඇති විටක ඔහුට හෝ ඔහුගේ භාරකරුට ඉදිරිපත් කළහැකිය.
- ගිවිසුමකින් හෝ භාවිතයෙන් බලය පවරා ඇති විටෙක තැපැලෙන් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ.
- බිල්පත ඉදිරිපත් කළ යුතු දිනය බැංකු නිවාඩු දිනයක් වේ නම්, බිල්පත ඊට පසුව එළඹෙන පළමුවෙනි ගනුදෙනු කරන දිනයේදීම ඉදිරිපත් කළ යුතුය.

**(මුළු ලකුණු 10)**

NOT FOR SALE

# නිවේදනය

මෙහි ලබාදුන් පිළිතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය “එසේම˜” යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු “ආදර්ශ පිළිතුරු˜” ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාහාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**

NOT FOR SALE